ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය
Business & Accounting Studies

| 60 | S | I, II |
|---|---|---|

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) තරග විභාගය 2024 (2025 ජනවාරි)
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2024 (2025 ஜனவரி)
Genaral Certificate of Education (Ord. Level) Examination, 2024 (January 2025)

ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය I, II
வணிகக் கல்வியும் கணக்கீடும் I, II
**Business and Accounting Studies I, II**

පැය තුනයි
*Three hours*

අමතර කියවීම් කාලය - මිනිත්තු 10යි.
**Additional Reading Time - 10 minutes**

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.

## ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය I

**උපදෙස් :**
* සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
* අංක **1** සිට **40** තෙක් ප්‍රශ්නවල දී ඇති (1), (2), (3), (4) යන පිළිතුරු වලින් **නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරා ගන්න.**
* **ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතරින් ඔබ තෝරා ගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (x) ලකුණ යොදන්න.**
* එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා ද පිළිපදින්න.

❖ පහත සිද්ධිය ඇසුරෙන් ප්‍රශ්ණ අංක 01 සිට 04 දක්වා පිළිතුරු සපයන්න.

නවීන තාක්ෂණික ක්‍රම උපයෝගි කරගෙන කාබනික පොහොර නිෂ්පාදනය පිළිබඳ විශේෂ පුහුණුවක් ලබා ඇති "අරංපොල" ඉවතලන ද්‍රව්‍ය භාවිතයෙන් කාබනික පොහොර නිෂ්පාදනය කරයි. ප්‍රමාණවත් ඉඩම් හිමියෙකු වන ඔහු ව්‍යාපාරික වශයෙන් කාබනික පොහොර නිපදවන්නේ ය. එළවලු හා මල් වගා කරන ප්‍රදේශයක මෙම නිෂ්පාදනාගාරය පිහිටුවා තිබීම ඔහුට වාසිදායක විය.

01. මෙම සිද්ධියේ සඳහන් අරංපොලගේ ව්‍යාපාරය,
   **(i)** භාණ්ඩ නිෂ්පාදන ව්‍යාපාරයකි. **(ii)** සේවා සපයන ව්‍යාපාරයකි.
   **(iii)** හවුල් ව්‍යාපාරයකි. **(iv)** ලාභ අරමුණු කර නොගත් ව්‍යාපාරයකි.

02. අරංපොලගේ ව්‍යාපාරයේ ශක්තියක් වන්නේ,
   **(i)** අරංපොල විශේෂ පුහුණුවක් ලබා තිබීම ය.
   **(ii)** අරංපොලට ඉලක්ක වෙළෙඳ පොලක් පැවතීම ය.
   **(iii)** අවට ඉවතලන ද්‍රව්‍ය බොහෝ ප්‍රමාණයක් පැවතිම
   **(iv)** කාබනික පොහොර භාවිතයට හුරු වූ ගොවීන් සිටීම ය.

03. අරංපොල විසින් නිෂ්පාදනය කරනු ලබන කාබනික පොහොර අයත් වන නිෂ්පදාන සාධකය වන්නේ,
   **(i)** භූමිය **(ii)** ශ්‍රමය ය. **(iii)** ප්‍රාග්ධනය ය. **(iv)** ව්‍යවසායකත්ව ය.

04. ඉහත සිද්ධියට අදාල වන නිවැරදි ප්‍රකාශය තෝරන්න.
   **(i)** අරංපොලගේ ව්‍යාපාරයට නීතිමය පුද්ගලභාවයක් ඇත.
   **(ii)** වාසනා, අරංපොලගේ ව්‍යාපාරයේ හවුල් කරුවෙකි.
   **(iii)** ගොවීන් අරංපොලගේ ව්‍යාපාරයේ ඇල්මැති පාර්ශවයක් නොවේ.
   **(iv)** එළවළු වගා කරන ගොවීන් සිටින ප්‍රදේශයක් වීම, මෙම ව්‍යාපාරයට කදිම අවස්ථාවකි.

05. රජය ව්‍යාපාර කෙරෙහි මැදිහත්වන ආකාර හා ඊට නිදසුන් පහත දැක්වේ.

| **X** තීරුව | | **Y** තීරුව | |
|---|---|---|---|
| 1. | හිතකර දිරිගැන්වීම් ලබා දීම | **A** | විදුලිය, මහා මාර්ග |
| 2. | පාරිභෝගික ආරක්ෂාව | **B** | බදු සහන |
| 3. | පරිසරය සුරකීම | **C** | පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය |
| 4. | යටිතල පහසුකම් | **D** | මධ්‍යම පරිසර අධිකාරිය |

ඉහත **X** තීරුවේ තොරතුරු **Y** තීරුවේ තොරතුරු සමඟ ගැලපූ විට නිවැරදි පිළිතුර වනුයේ,
   **(i) 1C, 2B, 3A, 4D** **(ii) 1A, 2B, 3C, 4D** **(iii) 1B, 2C, 3D, 4A** **(iv) 1D, 2C, 3B, 4A**

06. භාණ්ඩ නිෂ්පාදන ව්‍යාපාරයක ලක්ෂණයක් වන්නේ,
(i) ස්පර්ෂ කළ නොහැකි දෑ නිෂ්පාදනය කරයි. (ii) භෞතික පැවැත්මක් ඇති දෑ නිෂ්පාදනය කරයි.
(iii) වුවමනා සපුරාලන ක්‍රියාවක් හෝ ක්‍රියාවලියකි (iv) ගබඩා කර තබා ගත නොහැකි ය.

07. **A** - 2007 අංක 7 දරණ සමාගම් පණත
**B** - 1890 හවුල් ව්‍යාපාර ආඥා පණත
**C** - 1972 අංක 5 දරණ සමූපාකාර සමිති පණත
**D** - 1840 වංචා වැලැක්වීමේ ආඥා පණත
**E** - පළාත් සභා ව්‍යාපාර නාම ප්‍රඥප්තිය
මෙම තොරතුරු වලින් හවුල් ව්‍යාපාර වලට බලපාන පණත් වනුයේ,
(i) **ABC** පමණි. (ii) **ABCD** පමණි. (iii) **ABDE** පමණි (iv) **BCDE** පමණි.

08. බැංකු ජංගම ගිණුමක් පවත්වාගෙන යාමේ වාසියක් නොවන්නේ,
(i) පොලියක් ලැබීම. (ii) චෙක්පත් මගින් ගෙවීම් කිරිම
(iii) ඍජු ප්‍රේෂණ රැස් කිරිම. (iv) ස්ථාවර නියෝග ක්‍රියාත්මක කිරිම.

09. චෙක්පත් වල චුම්බක තීන්ත අක්ෂර හැඳුනුම් තීරුවේ (**MICR**) දැක්වෙන අංක අනුපිළිවෙලින් ඇති පිළිතුර වන්නේ,
(i) බැංකු අංකය, චෙක්පත් අංකය, බැංකු ගිණුම් අංකය, බැංකු ශාඛා අංකය
(ii) චෙක්පත් අංකය, බැංකු අංකය, බැංකු ශාඛා අංකය, බැංකු ගිණුම් අංකය.
(iii) චෙක්පත් අංකය, බැංකු ශාඛා අංකය, බැංකු අංකය, බැංකු ගිණුම් අංකය.
(iv) බැංකු ගිණුම් අංකය, බැංකු අංකය, බැංකු ශාඛා අංකය, චෙක්පත් අංකය.

10. රක්ෂණයට සම්බන්ධ වැරදි ප්‍රකාශය තෝරන්න.
(i) සේව්‍යයාට තම සේවකයන් වෙනුවෙන් සමූහ ජීවිත රක්ෂණ ඔප්පුවක් ලබා ගත හැක.
(ii) රක්ෂණ ආවරණය ලබා ගන්නා පාර්ශවය රක්ෂිතයා ලෙසින් හඳුන්වයි.
(iii) රථ වාහන රක්ෂණ ඔප්පුවක් ඇපයට තබා ණයක් ලබා ගත නොහැක.
(iv) දේපල රක්ෂණයට මෙන්ම ජීවිත රක්ෂණයට ද හානිපූරණ මූලධර්මය අදාල වේ.

11. මඟී ජනතාවගේ පහසුව සඳහා මාතර සිට දුම්රිය මාර්ග පද්ධතිය දියත් කරමින් විවිධ ස්ථාන වල දුම්රිය නැවතුම්පලවල් ඉදිකරමින් ඇති බව ප්‍රකාශ වේ. නව දුම්රියපළ ඉදි කිරිම ප්‍රවාහනයේ කවර මූලිකාංගයට අයත් වන්නේ ද ?
(i) පර්යන්තය (ii) මාර්ගය (iii) මාධ්‍ය (iv) බලය

12. තොග වෙළෙඳාමක් දැක්වෙන ප්‍රකාශය තෝරන්න.
(i) ජයමග ක්‍රීඩා සමාජයේ වාර්ෂික දන්සල සඳහා පරිප්පු 100**Kg** විකිණීම.
(ii) පාසල් ශිෂ්‍යයෙක් පොත් හලකින් අභ්‍යාස පොත් මිලට ගැනීම.
(iii) සහන් පෙරේරා තම නිවසේ සාදයකට සමගි බේකර්ස් වෙතින් පාන් රාත්තල් 10ක් ගැනීම.
(iv) මාතර හෝටලයට නිපුන හාල් 200**Kg** විකිණීම.

13. කළමණාකරණයේ දි පාලනය හා සම්බන්ධ නොවන ප්‍රකාශය මින් තෝරන්න.
(i) ව්‍යාපාරයේ කටයුතු සඳහා සේවකයින් පෙළඹවීම.
(ii) ගුණාත්වයෙන් යුතු නිෂ්පාදිත බිහි වී ඇත් දැයි සොයා බැලීම.
(iii) සැලසුම් කළ පරිදි නිෂ්පාදන අලෙවි ඇත් දැයි සොයා බැලීම.
(iv) අඩුපාඩු මගහරවා ගැනීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කිරිම.

14. අලෙවිකරණයට අයත් කාර්යයක් නොවන්නේ,
(i) විකුණුම් සේවකයින් පුහුණු කිරිම.
(ii) භාණ්ඩ නිෂ්පාදනය හා අලෙවිය සඳහා සැලසුමක් සකස් කිරිම.
(iii) භාණ්ඩයෙහි ගුණාත්වය පරීක්ෂා කිරිම.
(iv) භාණ්ඩය පිළිබඳ පාරිභෝගික ප්‍රතිචාර සොයා බැලීම.

15. රමල් සිරිවර්ධන ඔහු ඉතිරිකර ගත් රු. 500,000 ආයෝජන කිරිමට සූදානමින් සිටි. ඔහු අපේක්ෂා කරන ආයෝජනයෙන් ලැබෙන ප්‍රතිලාභ පහත පරිදි වේ.
1. ස්ථාවර ප්‍රතිශතයක් යටතේ පොලී ආදායමක් ලැබිම.
2 ඕනෑම අවස්ථාවක දී මුදල් බවට පත් කළ හැකි වීම
3. ආයෝජන කළ මුදල් ලැබීම සම්බන්ධයෙන් පූර්ණ රාජ්‍ය ආරක්ෂාවක් ලැබීම.

ඉහත දක්වන ලද ආයෝජන අවස්ථාව වන්නේ,
(i) කොටස් වල ආයෝජනය කිරිම. (ii) දේපල මිලදී ගැනීම.
(iii) භාණ්ඩාගාර බිල්පත් වල යෙදවීම (iv) ස්ථාවර තැන්පතුවක් ආරම්භ කිරිම

16. සාමාන්‍ය කොටස් ආයෝජනය තුළින් ලැබෙන ප්‍රතිලාභයක් නොවන්නේ කුමක් ද?
   **(i)** මිලදී ගත් කොටස් සඳහා ලාභාංශ ලැබීම.
   **(ii)** ණය ලබා ගැනීමේ දී සුරකුම් ලෙස ඉදිරිපත් කළ හැකි වීම
   **(iii)** සාමාන්‍ය කොටස් ගත් මිලට වඩා වැඩි වටිනාකමකට විකිණීමෙන් ප්‍රාග්ධන ලාභ ලබා ගත හැකි වීම.
   **(iv)** කොටස් සඳහා ඉහල පොලී ලැබීම.

17. ව්‍යාපාරයක සිදුවූ ගනුදෙනුවක් ගිණුම්කරණ සමීකරණයට පහත පරිදි බලපා ඇත.

| වත්කම් | = | හිමිකම් | + | වගකීම් |
|---|---|---|---|---|
| - 25,000 | = | + 75,000 | - | 100,000 |

   ඉහත සිදුවී ඇතැයි සිතිය හැකි ගණුදෙනුව වන්නේ,
   **(i)** බැංකු ණය රු. 100,000 ලබා ගෙන රු. 25,000 පෞද්ගලික ප්‍රයෝජනයට ගැනීම.
   **(ii)** මුදලින් රු. 25,000 පෞද්ගලිකව රු. 75,000 සමග ණය ගෙවා දැමීම.
   **(iii)** රු. 100,000 ක ණයක් ගෙන ප්‍රාග්ධනය ලෙස යෙදවීම.
   **(iv)** රු. 25,000ක් බඩු තොගයක් ණයටද රු. 75,000 බඩුතොගයක් පෞද්ගලික ප්‍රයෝජනයට ද ගැනීම.

18. පහත ගනුදෙනු අතරින් හිමිකම වැඩිවන ගනුදෙනුව තෝරන්න.
   **(i)** රු. 25,000 ක බැංකු ණයක් ගැනීම. **(ii)** රු. 25,000 ක කොමිස් ආදායමක් ලැබීම.
   **(iii)** රු. 3,800 ක වැටුප් ගෙවීම. **(iv)** රු. 12,000 ක ලී බඩු මිලදී ගැනීම.

❖ පහත සඳහන් සිද්ධිය ඇසුරෙන් ප්‍රශ්ණ අංක 19 හා 20 ට පිළිතුරු සපයන්න.

අනුරගේ ව්‍යාපාරයේ රු. 30,000 ක පිරිවැය වූ භාණ්ඩ තොගයක් සෙනුරගේ ව්‍යාපාරයට රු. 40,000 ට ණයට විකුණන ලදි. ණය ආපසු ගෙවීමේ දි ණය මුදලින් 10% ක වට්ටමක් ලබා දී ඇත.

19. ඉහත ගනුදෙනුව නිසා අනුරගේ ව්‍යාපාරයට ලද ලාභය කොපමණ ද ?
   (i) රු. 40,000 කි. (ii) රු. 10,000 කි. (iii) රු. 6,000 කි. (iv) රු. 4,000 කි.

20. සෙනුරගේ ව්‍යාපාරයේ මුදල් ගෙවීම සම්බන්ධ නිවැරදි ද්විත්ව සටහන කුමක් ද?

(i)

| | | |
|---|---|---|
| ණයහිමි ගිණුම | හර | රු. 40,000 |
| මුදල් ගිණුම | බැර | රු. 40,000 |

(ii)

| | | |
|---|---|---|
| ණයහිමි ගිණුම | හර | රු. 36,000 |
| මුදල් ගිණුම | බැර | රු. 36,000 |

(iii)

| | | |
|---|---|---|
| ණයහිමි ගිණුම | හර | රු. 40,000 |
| මුදල් ගිණුම | බැර | රු. 36,000 |
| ලද වට්ටම් ගිණුම | බැර | රු. 4,000 |

(iv)

| | | |
|---|---|---|
| ණයහිමි ගිණුම | හර | රු. 40,000 |
| මුදල් ගිණුම | බැර | රු. 36,000 |
| දුන් වට්ටම් ගිණුම | බැර | රු 4,000 |

21. "ව්‍යාපාරයක ලී බඩු ක්ෂය ගිණුම **A** වන අතර ගැනිලි ගිණුම **B** වේ."
   ඉහත ප්‍රකාශයේ **A** හා **B** ස්ථාන වලට අදාළ ගිණුම් වන්නේ,
   (i) වත්කම්, වියදම් (ii) වියදම්, ආදායම් (iii) වියදම්, හිමිකම් (iv) වත්කම්, හිමිකම්

❖ පහත තොරතුරු ඇසුරෙන් 22 හා 23 ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

| | ගනුදෙනුව | මූලික පොත. |
|---|---|---|
| 1. | රු. 4,000 ක භාණ්ඩ ණයට ගැනීම. | **A** - විකුණුම් ජ'නලය |
| 2. | රු. 16,000ක කාර්යාල උපකරණ ණයට ගැනීම | **B** - මුදල් පොත |
| 3. | රු. 17,000 ක භාණ්ඩ ණයට විකිණීම | **C** - ගැණුම් ජ'නලය |
| 4. | රු. 2,000 ක විදුලි බිලක් ගෙවීම | **D** - පොදු ජ'නලය |

22. ඉහත ගනුදෙනුව හා මූලික පොත් නිවැරදිව පිළිවෙලින් දැක්වෙන පිළිතුර වන්නේ,
   (i) 1B, 2D, 3A, 4C (ii) 1A, 2B, 3D, 4C (iii) 1D, 2C, 3A, 4B (iv) 1C, 2D, 3A, 4B

23. ඉහත ගනුදෙනු සඳහා අවශ්‍ය මුලාශ්‍ර ලියවිලි පිළිවෙලින් නිවැරදිව දක්වා ඇති පිළිතුර වන්නේ,
   (i) ජ'නල් වවුචරය, ගැණුම් ඉන්වොයිසිය, විකුණුම් ඉන්වොයිසිය, ගෙවීම් වවුචරය
   (ii) ගැණුම් ඉන්වොයිසිය, වවුචරය, ජ'නල් වවුචරය, ලදුපත
   (iii) ගැණුම් ඉන්වොයිසිය, ජ'නල් වවුචරය, විකුණුම් ඉන්වොයිසිය, ගෙවීම් වවුචරය
   (iv) ගැණුම් ඉන්වොයිසිය, විකුණුම් ඉන්වොයිසිය, ජ'නල් වවුචරය, ගෙවීම් වවුචරය

24. ගිණුම්වල සටහන් නොකරන නමුත්, මුලාශ්‍ර ලේඛණවල පමණක් සටහන් කරන වට්ටම් වර්ග වනුයේ,
   (i) මුදල් වට්ටම් ය. (ii) දුන් වට්ටම් ය. (iii) ලද වට්ටම් ය. (iv) වෙළෙඳ වට්ටම් ය.

25. නිමල්ගේ ව්‍යාපාරය කමල් සමාගමෙන් රු. 25,000ක් වටිනා භාණ්ඩ තොගයක් ණයට ලබා ගන්නා ලදි. අඩු කළ වට්ටම 10% කි. මෙම ගනුදෙනුවට අදාල නිවැරදි වටිනාකම් සහිත ද්විත්ව සටහන වන්නේ,

(i) ගැණුම් ගිණුම හර රු. 25,000
කමල් ගිණුම බැර රු. 25,000

(ii) කමල් ගිණුම හර රු. 25,000
ගැණුම් ගිණුම බැර රු. 25,000

(iii) ගැණුම් ගිණුම හර රු 22,500
කමල් ගිණුම බැර රු. 22,500

(iii) ගැණුම් ගිණුම හර රු. 25,000
කමල් ගිණුම බැර රු. 22,500
වට්ටම් ගිණුම බැර රු. 2,500

26. රසාංගගේ ව්‍යාපාරයේ සුළු මුදල් අග්‍රිමය රු. 5,000 කි. 2024.11.01 දිනට සුළු මුදල් භාරකරු සතුව රු. 600 ක් තිබුණි. නොවැම්බර් මස සිට අග්‍රිමය රු.6,000 දක්වා වැඩි කිරීමට ව්‍යාපාරය තීරණය කරන ලදි. නොවැම්බර් 01 දිනට ප්‍රතිපූර්ණය කිරීමට අදාල මුදල වන්නේ,

(i) රු. 6,000 (ii) රු. 5,400 (iii) රු. 5,000 (iv) රු. 4,400

27. පහත දැක්වෙන්නේ ගිණුම්කරණයේ සිදුවූ දෝෂයක් නිවැරදි කිරීමට අදාල ද්විත්ව සටහනකි.

අවිනිශ්චිත ගිණුම හර රු. 5,000
විකුණුම් ගිණුම බැර රු. 5,000

සිදු වී ඇතැයි අපේක්ෂා කළ හැකි ගිණුම්කරණ දෝෂය වන්නේ,

(i) රු. 5,000ක විකුණුම් ඉන්වොයිසියක් පොත් වලින් මගහැරීම.
(ii) රු. 5,000ක විකුණුම් ඉන්වොයිසියක් දෙවරක් පොත් වල සටහන් කිරීම.
(iii) රු. 25,000 ක අත්පිට විකුණුම් මුදල් පොතේ නිවැරදිව සටහන් කර විකුණුම් ගිණුමට රු. 20,000 ලෙස බැර කිරීම.
(iv) රු. 25,000 ක විකුණුම් ඉන්වොයිසියක් විකුණුම් ජනලයේ රු. 20,000 ලෙස සටහන් වීම.

28. බැංකු ප්‍රකාශණයේ දැක්වෙන ශේෂය හා ව්‍යාපාරයේ බැංකු ගිණුමේ පවතින ශේෂය අතර වෙනසට බල නොපාන හේතුව වන්නේ,

(i) රු. 2,000 ක බැංකු ගාස්තුවක් අයකර තිබීම.
(ii) රු. 8,000 ක ණය ගැතියෙකු සෘජුවම බැංකුවට මුදල් එවීම.
(iii) රු. 5,000 ක ණයහිමියෙකුට නිකුත් කළ චෙක්පතට බැංකුව ගෙවීම් කිරීම.
(iv) රු. 6,000 ක තැන්පත් කළ චෙක්පත බැංකුව ගිණුමට බැර නොකිරීම.

29. ව්‍යාපාරයක 2024.01.01 දිනට ව්‍යාපාරයේ බැංකු ගිණුමේ ශේෂය රු. 15,500 ක් වූ අතර, එදිනට බැංකු ප්‍රකාශයට අනුව ශේෂය රු. 16,000 ක් විය. මෙම වෙනසට හේතු වන ගනුදෙනුව තෝරන්න.

(i) බැංකුව විසින් අයකර ගත් රු. 500 ක බැංකු ගාස්තු
(ii) බැංකුවට සෘජුවම ලැබී තිබූ ආයෝජන ආදායම රු. 500
(iii) ස්ථාවර නියෝග මත බැංකුව අයකර ගත් රු. 500ක රක්ෂණ වාරික.
(iv) තැන්පත් කළ නමුත් නිශ්කාශණය නොවූ චෙක්පත් රු. 500

❖ පහත තොරතුරු ඇසුරෙන් ප්‍රශ්ණ අංක 30 හා 31 පිළිතුරු සපයන්න.
දිලෙන තරු ක්‍රීඩා සමාජයේ 2024.01.01 දිනට සාමාජික සංඛ්‍යාව 100කි. සාමාජිකයෙකු මාසික සාමාජික ගාස්තුව රු. 50 කි. 2024 තුලදි සාමාජිකයින් 90 කි. 2024 වර්ෂයේ දී සාමාජිකයින් හතර දෙනෙකු 2024 හා 2025 වර්ෂ දෙකටම සාමාජික මුදල් ගෙවා තිබුණි.

30. 2024 වර්ෂයේ ලැබීම් හා ගෙවීම් ගිණුමට ඇතුළත් කළ යුතු සාමාජික මුදල් ප්‍රමාණය කොපමණ ද?

(i) රු. 58,800 (ii) රු. 4,800 (iii) රු. 60,000 (iv) රු. 54,000

31. 2024 වර්ෂය අවසානයේ පිළියෙල කරන ආදායම් ප්‍රකාශයේ සාමාජික මුදල් ආදායම කොපමණ ද?

(i) රු. 54,000 (ii) රු. 4,800 (iii) රු. 58,800 (iv) රු. 60,000

32. "රස" බේකරි නිෂ්පාදන ආයතනයේ මාසයකට අදාළ තොරතුරු පහත දැක්වේ.

| | |
|---|---|
| තිරිඟු පිටි සඳහා පිරිවැය | 100,000 |
| මුරකරු වැටුප් | 20,000 |
| කම්හල් කුලි | 15,000 |
| විදුලිය | 12,000 |
| නිෂ්පාදන වැටුප් | 40,000 |

මෙම ආයතනයේ ප්‍රාථමික පිරිවැය හා පොදුකාර්ය පිරිවැය පිළිවෙලින් දැක්වෙන්නේ,

(i) රු. 135,000 ක් හා රු. 55,000 ක් ලෙස ය.
(ii) රු. 140,000 ක් හා රු. 47,000 ක් ලෙස ය.
(iii) රු. 120,000 ක් හා රු. 70,000 ක් ලෙස ය.
(iv) රු. 147,000 ක් හා රු. 43,000 ක් ලෙස ය.

33. පහත දැක්වෙන්නේ නිෂ්පාදන පිරිවැය මූලිකාංග සම්බන්ධ සමීකරණ කිහිපයකි. එයින් වඩාත් නිවැරදි පිළිතුර ඇතුළත් සමීකරණය වන්නේ,
   (i) ප්‍රාථමික පිරිවැය = ඍජු ද්‍රව්‍ය පිරිවැය + ශ්‍රම පිරිවැය + ඍජු වෙනත් වියදම්
   (ii) ඍජු නිෂ්පාදන පිරිවැය = ඍජු ද්‍රව්‍ය පිරිවැය + ඍජු ශ්‍රම වියදම් + වෙනත් පිරිවැය
   (iii) වක්‍ර නිෂ්පාදන පිරිවැය = වක්‍ර ද්‍රව්‍ය වියදම් + වක්‍ර ශ්‍රම වියදම් + ඍජු වෙනත් පිරිවැය
   (iv) මුළු නිෂ්පාදන පිරිවැය = ප්‍රාථමික පිරිවැය + නිෂ්පාදන පොදු කාර්ය පිරිවැය.

34. එරංගගේ ව්‍යාපාරයේ 2024.12.31 දිනට බැංකු ණය පොළිය රු. 9,000 ගෙවා තිබුණු අතර මාසික පොලිය රු. 1,000 කි. මෙම ව්‍යාපාරයේ 2024.12.31 වන විට,
   (i) ගෙවූ බැංකු ණය පොලී ගිණුමේ ශේෂය රු. 1,000 කි.
   (ii) මූල්‍ය තත්ව ප්‍රකාශයේ උපචිත බැංකු ණය පොලී රු . 3,000 කි.
   (iii) මූල්‍ය තත්ව ප්‍රකාශයේ උපචිත බැංකු ණය පොලී රු. 12,000 කි.
   (iv) බැංකු ණය පොලී ගිණුමේ ශේෂය රු. 10,000 කි.

❖ පහත තොරතුරු ඇසුරෙන් ප්‍රශ්ණ අංක 35 සිට 40 තෙක් ප්‍රශ්ණ වලට පිළිතුරු සපයන්න.

**බිනාලිගේ ව්‍යාපාරය**
**2024.12.31 දිනට ශේෂ පිරික්සුම (උද්ධෘත)**

| | |
|---|---|
| 2024.01.01 තොගය | 20,000 |
| ප්‍රාග්ධනය | 180,000 |
| ස්ථාවර වත්කම් | 178,200 |
| බෙදාහැරීමේ වියදම් | 15,100 |
| ගැණුම් | 23,000 |
| විකුණුම් | 100,000 |
| ණයහිමියෝ | 35,000 |
| ලද වට්ටම් | 12,000 |
| දුන් වට්ටම් | 5,000 |
| ගැනිලි | 3,000 |
| මූල්‍ය වියදම් | 7,200 |
| බැංකු ණය | 20,000 |
| ගෙනඒමේ කුලි | 2,000 |
| බොල් ණය | 1,500 |

අමතර තොරතුරු :
- 2024.12.31 තොගය රු . 5,500
- ස්ථාවර වත්කම් වාර්ෂිකව 10% බැගින් ක්ෂය කළ යුතුය.
- 2024 වර්ෂය සඳහා උපචිත වැටුප් රු. 25,000

35. 2024.12.31 න් අවසන් වර්ෂය සඳහා විකුණුම් පිරිවැය,
   (i) රු. 10,500 (ii) රු. 3,950 (iii) රු. 42,600 (iv) රු. 39,500

36. 2024 වර්ෂයේ දළ ලාභය,
   (i) රු. 60,500 (ii) රු. 63,400 (iii) රු. 39,500 (iv) රු. 42,600

37. 2024.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පිළියෙල කරන ලද ලාභ හෝ අලාභ ප්‍රකාශණයේ දැක්විය යුතු මුළු වියදම් වල වටිනාකම වනුයේ,
   (i) රු. 42,820 (ii) රු. 25,000 (iii) රු. 21,900 (iv) රු. 71,620

38. 2024.12.31 දිනට ව්‍යාපාරයේ මෙහෙයුම් ප්‍රතිඵලය,
   (i) 1,120 (ලාභය) (ii) රු. 1,120 (අලාභය) (iii) රු. 880 (ලාභය) (iv) රු. 880 (අලාභය)

39. 2024.12.31 දිනට මූල්‍ය තත්ව ප්‍රකාශණයේ දැක්විය යුතු ස්ථාවර වත්කම් වල ධාරණ වටිනාකම,
   (i) රු.178,200 (ii) රු. 160,380 (iii) රු. 196,020 (iv) රු. 17,820

40. 2024.12.31 දිනට අයිතිකරුගේ මුළු හිමිකම කොපමණ ද ?
   (i) රු.177,000 (ii) රු. 181,120 (iii) රු. 175,880 (iv) රු. 177,880

සා.පෙළ ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයන දේශක
සිසිර කුමාර
විසින් සම්පාදිත යි.